# දේශීය ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය






සැකසුම :- කෞශල්‍යා ගම්ලත්
ර/ විද්‍යාරාජ විද්‍යාලය
බටුගෙදර

# දේශීය ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය යනු

විදේශීය බලවේග හමුවේ දේශීයත්වය රැක ගැනීමට ලාංකිකයින් ගෙනගිය ව්‍යාපාරයයි.

# විදේශීය බලවේගය :- මිෂනාරි ව්‍යාපාරය

- මිෂනාරි ව්‍යාපරය යනු ඉංග්‍රිසීන් විසින් ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත කිරීම සදහා ගෙනගිය ව්‍යාපාරයයි.
- මෙකල ලංකාවට පැමිණි මිෂනාරි කණ්ඩායම් කිහිපයකි.
- ඔවුන් ලංකාවේ විවිධ ප්‍රදේශ වල ව්‍යාප්ත වී ක්‍රිස්තියානි ආගම හා එම සංස්කෘතිය ප්‍රචාරය කරන ලදි.

| මිෂනාරි සංවිධාන | ව්‍යාප්ත වූ ප්‍රදේශ |
| --- | --- |
| බැප්ටිස්ට් මිෂනාරි සමාගම | කොළඹ |
| වෙස්ලියන් මිෂනාරි සමාගම | කොළඹ , කළුතර , ගාල්ල, මීගමුව, යාපනය |
| අමෙරිකන් මිෂනාරි සමාගම | යාපනය |
| එංගලන්ත මිෂනාරි සමාගම | කොළඹ , ගාල්ල, කල්පිටිය, මන්නාරම, මහනුවර |
| චර්ච් මිෂනාරි සමාගම | කොළඹ , ගාල්ල, කල්පිටිය, මන්නාරම, මහනුවර |

# මිෂනාරි සංවිධාන ආගම ප්‍රචාරය කිරීම සඳහා ගෙනගිය ක්‍රියාමාර්ග

## 01.ලේඛනය

- ❑ විවිධ පුවත්පත් සගරා මුද්‍රණය කොට ජනතාව අතර බෙදාහැරීම
  - ❑ මාසික තැග්ග
  - ❑ ලංකා නිධානය
  - ❑ උරගල

## 02.දේශනය

- ❑ පන්සල් හා ජනතාව රැස්වන ස්ථාන වල ක්‍රිස්තියානි පූජක වරු විසින් දේශන හා සාකච්ඡා පවත්වමින් ආගම ප්‍රචාරය කිරීම

## 03.අධ්‍යාපනය

- ❑ පාසැල් ආරම්භකොට ඒ මගින් ආගම පැතිර වීම
  - ❑ ස්වභාෂා පාසල්, බාලිකා පාසල්, පූණ්‍ය පාසල්, නේවාසික පාසල්, සෙමනේරි
  - ❑ මෙම පාසල් රජයේ අනුග්‍රහය ලැබූ අතර ආගම ප්‍රචාරය ප්‍රධාන අරමුණ විය

- **ක්‍රිස්තු භක්තිකයින්ට, කතෝලිකයින්ට විශේෂ වරප්‍රසාද ලැබීම**
- **දේශිය ආගම් හා සංස්කෘතීන් පරිහානියට පත්වීම**
- **මේ නිසා දේශීය ආගම් හා සංස්කෘතීන් නගා සිටුවීමට දේශීය ජනකොටස් (බෞද්ධ, හින්දු, ඉස්ලාම්) නැගී සිටීම**
- **මිෂනාරි වරු යොදාගත් මාධ්‍යයන්ම යොදා ගනිමින් ඔවුන් තම ආගම් නැවත පිබිදවීමේ ව්‍යාපාරයක් දියත් කිරීම**

# බෞද්ධ පුනරුද ව්‍යාපාරය

- වැලිවිට සරණංකර හිමියන් විසින් පදනම දැමීම
- සෙසු නායකයින්

- *පැවිදි නායකයින්*
  - *වලානේ සිද්ධාර්ථ හිමි*
  - *හික්කඩුවේ සුමංගල හිමි*
  - *මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි*
  - *බුලත්ගම ධම්මාලංකාර හිමි*
  - *එස්. මහින්ද හිමි*
- *ගිහි නායකයින්*
  - *අනගාරික ධර්මපාල තුමා*
  - *හෙන්රි ස්ටීල් ඕල්කොට් තුමා*
  - *වලිසින්හ හරිස්චන්ද්‍ර තුමා*
  - *ඩී.බී.ජයතිලක මහතා*
  - *ආතර් වී දියෙස්*
  - *පියදාස සිරිසේන මහතා*

- පරම විඥානාර්ථ සමාගම, මහා බෝධි සමාගම, තරුණ බෞද්ධ සංගමය පිහිටුවීම (ඕල්කොට් තුමා, අනගාරික ධර්මපාල තුමා)







# බෞද්ධ පුනරුද ව්‍යාපාරය සඳහා යොදාගත් මාධ්‍යයන්

- ලේඛන මාධ්‍ය
  - *මුද්‍රණාල පිහිටුවීම - ලංකාතිලක විශෘත, සරසවි සදරැස, සුදර්ශන , කවට කථිකයා ආදී මුද්‍රණාල පිහිටුවීම*
  - *පුවත්පත් ,සගරා පොත් මුද්‍රණය - ලක්මිණි පහන, සරසවි සදරැස*
- දේශන මාධ්‍ය
- *පංච මහා විවාද පැවැත්වීම*
  - *පානදුරා වාදය*
  - *වරාගොඩ වාදය*
  - *උදන්ගොඩ වාදය*
  - *බද්දේගම වාදය*
  - *ගම්පොල වාදය*
- අධ්‍යාපනය
  - *පිරිවෙන් අධ්‍යාපනය*
  - *ඉරුදින දහම් පාසල්*
  - *බෞද්ධ පාසල් ඇතිකිරීම (කොළඹ ආනන්ද විද්‍යාලය , ගාල්ල මහින්ද විද්‍යාලය )*
- වෙනත් ව්‍යාපාර ඇරඹීම
  - *ජාත්‍යාලය වර්ධනය කිරීමේ ව්‍යාපාරය*
  - *පූජනීය ස්ථාන රැක ගැනීමේ ව්‍යාපාරය*
  - *අමද්‍යප ව්‍යාපාරය*
  - *ආගමික උත්සව*


සරසවි
සඳරැස
වෙසක් උදාව අප වෙත ගෙනෙන
විමුක්තියේ මංගල පණිවුඩය
නුවණ නිවනට මඟයි




ආනන්ද විද්‍යාලය 1942

# හින්දු පුනරුද ව්‍යාපාරය

## ආරුමුග නාවලර් තුමා පුරෝගාමී වීම හා පොන්නම්බලම් රාමනාදන්, පොන්නම්බලම් අරුනාචලම් යන දෙදෙනා එය ඉදිරියට ගෙන යාම

- යාපනයේ වන්නියාර් පොන්නෙයි හි හින්දු විද්‍යාලය ඇරඹීම
- එහි මුද්‍රණාලයක් ඇරඹීම
- උදයභාණු පුවත්පත පල කිරීම
- ශෛව විද්‍යාසාලෛ නැමති ඉංග්‍රීසි පාසල ඇරඹීම
- ශෛව පරිපාලන සභාව පිහිටුවීම
- හින්දු දරුවන්ට නිවසේ ඉගැන්වීම හා ඔවුන්ට පොත් රචනා කිරීම ( පෙරිය පුරාණම්, ස්කන්ද පුරාණම්)





Sir Ponnambalam Arunachalam    Sir Ponnambalam Ramanathan

# ඉස්ලාම් පුනරුද ව්‍යාපාරය

## සිද්ධි ලෙබ්බෙ මහතා පුරෝගාමී වීම හා ටී. බී. ජයා මහතා එය ඉදිරියට ගෙන යාම

- කොළඹ මුස්ලිම් සංගමය පිහිටුවීම
- සහිරා විද්‍යාලය ඇරඹීම
- අරාබි භාෂාව හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම ව්‍යාප්ත කිරීම
- මද්‍රාසා පාසල් ආරම්භ කිරීම
- කාන්තාවන් සදහා පාසල් ඇරඹීම
- මුස්ලිම් නේෂන් පුවත්පත ඇරඹීම
- ඉස්ලාම් රිවීව් සගරාවට ලිපි සැපයීම



මෙලෙස බ්‍රිතාන්‍යයන්ගේ බලපෑම් වලට එරෙහිව දේශීය ආගම්,දේශීය සම්ප්‍රදායන් හා සංස්කෘතීන් ආරක්ෂා කොට ගැනීම සදහා දේශීය නායකයෝ කටයුතු කළහ.